# “සීතාවක පුරාණය” ට පෙර වදනක් !

*පරන්ගින් සමඟ එතුමා ගෙන ගිය සටන යම් හෙයකින් අසාර්ථක නොවුණානම් අද අපේ දේශයේ ඉතිහාසය වෙනත් මඟක් ගන්නට තිබුණු බව මගේ හිත කියයි. සීතාවක පිළිබඳ අතීතය හාරා අවුස්සා බැලීමට මගේ සිත ඇදී ගියේ ඒ නිසා ය. පියා මැරීමේ චෝදනාවෙනුත්, සඟුන් මැරීමේ චෝදනාවෙනුත් ටිකිරි බණ්ඩාර රාජසිංහයන් නිදහස් කර ගැනීමට විත්තියේ නීති වේදියා වීමට මම අදහස් කළෙමි.”*

නව වසරේ නව අංගයක් ලෙසින් “සන්නස” පාඨකයන් වෙත පිරිනමන්නට මුලපිරෙන ලිපි පෙළක පළමුවැන්යි මේ. ඓතිහාසික තොරතුරු අළලා ලියැවුණ ලිපි මින් පෙර දී ද පළ වී ඇති නිසාවෙන් පාඨකයනට එය නුහුරු අත්දැකීමක් නො වූව ද කාරණා දෙකක් හේතුවෙන් අදින් ඇරඹෙන මෙම ලිපිය අනෙක්වාට වඩා වෙනසක් වනු ඇතැයි සිතන්නෙමු.

අපගේ පුරාවත පිළිබඳ ලියැවුණ ග්‍රන්ථ යන්ගේ උපුටනයකන් හෝ ඒ ආශ්‍රිතව ලියැවුණු ලිපි වෙනුවට ග්‍රන්ථය එළෙසින් ම “සන්නස” මාසිකයේ පළකිරීමට ගත් කතුවරයාගෙන් ලත් අවසරයයි පළමු වැන්න.

සිංහල රාජධානි අතර අවම වශයෙන් තොරතුරු ලියැවුණු රාජධානියක් වන සීතාවක රාජධානිය පිළිබඳව ලියැවෙන ලිපි පෙළක් විමයි දෙවැන්න.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථියෙකු වශයෙන් සිටියදී තමන් හැදෑරූ “පුරා විද්‍යාව” විෂය යටතේ කළ පර්යේෂණයන්ගෙන් ද සීතාවක රාජධානියේ ම පිහිටා තිබෙන අවිස්සාවේල්ල, තල්දූව ග්‍රාමයේ උපන් දා පටන් වෙසෙන ගැමියෙකු ලෙසින් පරිසරයෙන් ලැබූ දැණුමෙන් ද, වසර ගණනාවක් තිස්සේ ගුරුවරයෙකු විදුහල්පතිවරයෙකු වශයෙන් සිසු දරුවන් පෝෂණය කිරීම සඳහා එක් රැස් කළ දැනුමෙන් ද පෝෂිත වූ “සීතාවක පුරාණය” ගත් කතුවර ශාස්ත්‍රවේදී ගා.ලි. සාර්ලිස් අමරසිරි වියතාණන් පිළිබඳව කෙටි හැඳින්වීමකින් ලිපියට මුල පිරීම මැනවැයි සිතමු.

සීතාවක ඓතිහාසික රාජධානියේ කෝරළ තුනෙන් එකක් වූ අටුළුගම කෝරළයේ ඉහළ තල්දූවේ ඉපිද පසුකලෙක අවිස්සාවේල්ල සීතාවක මහාවිද්‍යාලය, ගලපිටමඩ වළගම්බා මහා විද්‍යාලය, අටුළුගම මායාදුන්න මහා විද්‍යාලය වැනි විදුහල්හි විදුහල්පතිවරයාව සිට අද වන විට විශ්‍රාම සුවයෙන් ගත කරන නාපේ ලියනාරච්චිලාගේ සාර්ලිස් අමරසිරි ගුරුපියාණන් දඹදෙනි රාජ්‍යයේ රජකළ දෙවැනි පරාක්‍රමබාහු රජතුමාණන්ට පුස්කොළ පත් ලියා දුන් මුතුන්මිත්තන්ගෙන් පැවත එන නිසාවෙන් ඒ නම් වල සරසවි සිසු දිවියේ දී මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් සෙවනේ එතුමාණන්ගේ නිර්මාණ සඳහා තාල වාද්‍ය භාණ්ඩ වයමින් කලාත්මක හැකියාවන් පෑ සාර්ලිස් කලාකරුවා දක්ෂ ලී කැටයම් ශිල්පියෙකුද වන්නේ ය. වෙද පරපුරකින් පැවත එන සිය මෑණියන් ඇසුරෙන් මේ වන විට ප්‍රදේශයේ දක්ෂ වෛද්‍යවරයෙකු වූ සාර්ලිස් වෙදැදුරුතුමා දක්ෂ නක්ෂත්‍රවරයෙකු ද වෙයි. ඉංග්‍රීසි මාධ්‍යයෙන් ශිල්ප කළ ද පසු කාලීනව සිංහල ගුරුවරයෙකු ලෙසින් සිසුන් ශ්‍රාණය කිරීමට ම සීමා නොවී කළා වූ “සම්බුලා” වැනි ඇතැම් වේදිකා නාට්‍ය ගුවන්විදුලියට ද එක් විය. සිය විශ්‍රාම ගැනිමෙන් අනතුරුව කෙටි කලක් වාමාංශික දේශපාලනයට සම්බන්ධව තමන් උපන් ගම් පියසට ද අනුපමේය සේවයක් කරන්නට අමතක නොකළ සාර්ලිස් ප්‍රදේශීය සභා මන්ත්‍රීවරයා මේ වන විට සිය දරු මුණුපුරන් සමඟින් විවේක සුවයෙන් පසුවන්නේය.

පේරාදෙණිය සරසවියේදී සෙනරත් පරණවිතාන ශූරීන්ගෙන් ද සිය පෞරාණික දැනුම සම්භාරය ග්‍රන්ථයන් මගින් ද, පුවත්පත් හා සඟරා ලිපි මඟින්ද රූපවාහිනී හා ගුවන්විදුලි වැඩසටහන් මගින්ද බෙදා හදා දෙන සාර්ලිස් ඇදුරාණන් සීතාවක රාජධානියේ “බැළුම් ගල” නමින් වහරෙහි එන කොබෝතුරා කන්දට මුහුණලා පිහිටි සිය නිවහනේ සිට ලියූ “සීතාවක පුරාණය” ග්‍රන්ථයේ පෙර වදනේ උද්ධෘතයකින් ම ලිපි පෙළ මෙලෙසින් ඇරඹෙයි.

“පාසල් යන අවදියේ දී මට දිනක් මගේ සගයෙකු ද සමඟ සීතාවක හෙරණ්ඩි දෙවොල බැලීමට ගියෙමි. එහි වූ පාෂාණමය නිමැවුම් දුටු මගේ සිතට එක්තරා චමත්කාරයක් දැණුනි. සීතාවක රාජසිංහයන්ගේ චරිතය කියැවීමෙන් මා දුටුවේ ඊටත් වඩා අභිමානනීය ආලෝකයකි. පරන්ගින් සමඟ එතුමා ගෙන ගිය සටන යම් හෙයකින් අසාර්ථක නොවුණානම් අද අපේ දේශයේ ඉතිහාසය වෙනත් මඟක් ගන්නට තිබුණු බව මගේ හිත කියයි. සීතාවක පිළිබඳ අතීතය හාරා අවුස්සා බැලීමට මගේ සිත ඇදී ගියේ ඒ නිසා ය. පියා මැරීමේ චෝදනාවෙනුත්, සඟුන් මැරීමේ චෝදනාවෙනුත් ටිකිරි බණ්ඩාර රාජසිංහයන් නිදහස් කර ගැනීමට විත්තියේ නීති වේදියා වීමට මම අදහස් කළෙමි.”

“එසේ ම තල්දූවේ බිරාඬි දෙවොල පිළිබඳව ද පවත්නා ජයග්‍රාහී සිතුවිලි බවත් කර තව දුරටත් ඈත අතීතයට එබී බලා මෙම මහානර්ඝ පුරා වස්තුවේ සංස්කෘතික අගය යථාර්ථවාදීව සමාජයට පෙන්වා දීමට මම උත්සාහ කළෙමි. මෙම දෙවොල අරිට්ටකී වෙණ්ඩු පෙරුමාල් නම් වඩක්ක ආඬිගුරුගේ නිර්මාණයක් හැටියට පවතින මතය වැරදි බව පෙන්වා දීමටත් ඈත සමයක සිට පැවති ජගන්මාතා පිදීමේ විශ්වාසයට නෑකම් කියන දෙවොලක් බව ඔප්පු කිරීමටත් මම සාදක සෙවීමි. උපාධියට පුරාවිද්‍යාව හැදෑරීමේදී රැස් කරගත් සටහන් මට බෙහෙවින් උපකාරී විය. විවිධ පුද්ගලයන් හමු වී සාකච්ඡා කිරීමෙන් නොයෙකුත් ජනකතා මතවාද සොයාගැනීමට මට හැකි විය.”

සිය ග්‍රන්ථය වෙනුවෙන් සාර්ලිස් ලේඛකයාණන්ට දුන් දායකත්වයට සිය කෘතවේදිතාවය පළ කරමින් ලියූ මේ වැකිය ද මෙහිලා ඇතුලත් කෙරෙන්නේ ඔවුනට අපගේද කෘතවේදීත්වය දැක්වීම යුතුකමක් වන



නිසාවෙනි.

“මෙම කාර්යයේදී නන් අයුරින් මට දිරිය දුන් හැම දෙනාටම මම පින් දෙමි.....”

ගුරු පියෙකු ලෙසින් තමන් ලත් දැණුම බෙදා හදා දීමට දුන් සේම “සීතාවක පුරාණය” ග්‍රන්ථයට කැටි කළ තොරතුරු, සම්පත් “සන්නස” පාටකයින්ට බෙදා හදා දීමට දුන් අවසරය පිළිබඳව අපදු එතුමන්ට කෘතවේදී වන්නෙමු.

ලබන වසර “සන්නස” මාසිකයෙන් “සීතාවක පුරාණය” ග්‍රන්ථයේ “ඈත යටගියාව” බලාපොරොත්තු වන්න.

සකස්කළේ

සිසිර දිසානායක

